2020 Dinamina and Silumina -Varuna Priyanka -varuna2@gmail.com -0718770303

රුහුණු සරසවි ආචාර්යවරුන් දෙදෙනෙක් දුර සිට උෂ්ණත්වය බලන උපකරණයක් අගමැති ට පිරිනමති

රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් දෙදෙනකු විසින් දුරස්ථ ව ක්‍රියා කළ හැකි උෂ්ණත්වය මැන බලන උපකරණයක් නිපදවා තිබේ. එය අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත පරිත්‍යාග කළ අයුරු.

නෝර්වේ හි ශ්‍රී ලංකා නව තානාපති අගමැති මහින්ද හමු වෙයි

නෝර්වේ හි ශ්‍රී ලංකා නව තානාපති ගොඩ්රි කුරේ මහතා අරලියගහ මන්දිරයේ දී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (02) හමු වූ අවස්ථාව.

බන්ධනාගාර ගැන ජනාධිපතිගෙන් සැර කතාවක්

ගෞරවනීය සේවාවක් නොදී ඉහළ නිල අරන් වැඩක් නෑ

කුඩු, පාතාල හැම දේම පාලනය බන්ධනාගාරය ඇතුළෙන්

මේවා නවත්තන්න බැරි නම් පඩි දී පැත්තකට දානවා

බන්ධනාගාර සේවයේ තමන් ඉහළම නිලධාරියෙක් යැයි පැවැසීමට හැකි වන්නේ ජනතාව බලාපොරොත්තු වන ගෞරවණීය සේවයක් ඉන් ලබා දෙන්නේ නම් පමණක් යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

එලෙස පැවැසීමට හැකි තත්ත්වයක බන්ධනාගාරය තැති බවත් කමිටුවක් පත් කර ඒ තුළින් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් සකසන ලෙසත් හෙතෙම උපදෙස් ලබා දුන්නේය. බන්ධනාගාරවල අභ්‍යන්තර තත්ත්වය විමර්ශනය කිරීමට ජනාධිපති කාර්යාලයේ පෙරේදා (01) පැවැති සාකච්ඡාවේ දී ජනාධිපතිවරයා එසේ කියා සිටියේය.

මෙහි හොඳ නිලධාරීන් ඉන්නා බවට ඇතැම් අය පවසන හෙයින් එම නිලධාරීන් නරක නිලධාරීන් ද හොඳ මාර්ගයට හද ගන්නා ලෙස ඉල්ලා සිටි ජනාධිපතිවරයා එසේ හදන්නට බැරි කොටසක් ඉන්නේ නම් ඒ අයට වැටුප් දී වෙනම සංචිතයක ට දමා පැත්තකට කර තබන්නැයි ද කීවේය. එහිදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

"ජනතාව අතර තියෙන මතය බොහෝම නරකයි. සමහර අය අහනවා මේ බන්ධනාගාර තියෙන්නේ මොකටද වහලා දාන්න කියලා. මේක හැදෙන්න ඕන. දැන් බැලුවොත් මේක අලුත් දෙයක් නෙවෙයි අවුරුදු ගාණක් තිස්සේ තියෙන දෙයක්. නමුත් මේක හැදෙන්නේ ඕන. නැත්නම් මේක කරන්න බැහැ. සමාජයේ වැදගත් එක්තරා ආයතනයක්. වැරදි කළාට පස්සේ යන්නේ මෙතැනට. එතැන දී හරියට මේක වෙන්නේ නැත්නම් එතන විශාල ප්‍රශ්නයක් තියෙනවා. සමහර වේලාවට අනෙක් අය මේකට අතගහන්නේ නැතුව ඇති. නමුත් මට ජනතාව දීලා තියෙන බලය තමයි ඒක. මම වෙන දේවල් බලන්නේ නැහැ. මට ඕන ඒක කරන්න. ඉතින් මම ඒක අනිවාර්යයෙන් කරනවා. කවුරු තරහා වුණත් කවුරු යාළු වුණත් ඒක මට ප්‍රශ්නයක් නැහැ. ඒක කරලම තමයි මම නවතින්නේ. ඒක නිසා මං මේ බන්ධනාගාරයේ හැමෝටම කියන්නේ මට ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලෝ හැදුනේ නැති වුණොත් මං හදනවා.

"මොකද කුඩු ගෙන්නන්නේ බන්ධනාගාරේ ඇතුළේ ඉඳලා. පාතාලේ වැඩ කටයුතු කරන්නෙත් බන්ධනාගාරේ ඇතුළේ. ත්‍රස්තවාදී ව්‍යාපාර කටයුතු කරන්නෙත් බන්ධනාගාරේ ඇතුළේ ඉඳලා. බන්ධනාගාරේ කරන්න එපා කියන හැම දෙයක්ම වෙනවා. බන්ධනාගාරයට යවන්නේ හැදෙන්න කියලා. ජනතාවට අවශ්‍ය ඒක. රටට අවශ්‍ය ඒක. මේක විහිළුවක්නේ. ටෙලිෆෝන් ඇතුළේ තියෙනවා. කුඩු ඇතුළට ගෙනියනවා. අවි ආයුධ ඇතුළට ගෙනියනවා. සැලසුම් කරන්නේ ඇතුළේ ඉඳලා. මේක විහිළුවක්නේ. අපිට මුහුණ දෙන්න පුළුවන් ද එහෙම තත්ත්වයකට? මට ඕන මේක හරි විදියට ක්‍රියාත්මක වෙන්න. තමන්ට අයිති වැඩේ කරන්න බැරි මොකද? ටෙලිෆෝන් එකක් ඇතුළට ගෙනියන එක වළක්වා ගන්න බැරිද? එහෙම නම් වැඩක් නැතේ ඕගොල්ලන්ගෙන්. සේවයේ ඉඳලා කමිෂනර් වෙන්න ඕන කිව්වට වැඩක් නැතේ. ඕගොල්ලෝ කතා කරන්න දැන්. ඔයාලනේ දෙපාර්තමේන්තුවේ ඉන්න ඉහළම කට්ටිය. කොහොමද මේක ඇතුළේ ඉඳලා ඔපරේෂන්ස් කරන්නේ. අල්ලාගෙන හිරේ දලා ඉන්න මිනිස්සු පාතාලේ වැඩ කරන්නේ එතැන ඉඳලා. ඊළඟට කුඩු ගේන එක කරන්නේ එතැන ඉඳලා. ඇයි ඕගොල්ලන්ට ඒක නවත්තන්න බැරි? මේක ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක්නේ.

"මං මේ කතා කරන්නේ කොහොමද තමන් ආත්ම ගරුත්වයක් ඇතුව හෘද සාක්ෂියට විරුද්ධ වෙන්නේ නැතුව කුඩු කාරයකුට මේක කරන්න දෙන්නේ කොහොමද? පාතාලේ නායකයකුට මේක කරන්න දෙන්නේ කොහොමද? මම අහන්නේ අන්න ඒවා. ඉතින් ඕගොල්ලොන්ට පැහැදිලිවම යම් කිසි කාර්යභාරයක් ඉටු කරන්නට තියෙනවා. පහළ මට්ටමේ ඉඳලා මේක තේරුම් කරලා දෙන්න. මොකද මේ විදිහට ඇත්තටම අපිට යන්න පුළුවන්කමක් නැහැ. අපේ පොලිසිය කඩා වැටිලා තම්, බන්ධනාගාර කඩා වැටිලා තම් කොහොමද අපි නීතිය තියෙන රටක් හදන්නේ. අපිට කරන්න පුළුවන්කමක් නැහැ. හැම කෙනෙක්ම ඒ ආයතනයක සාමාජිකයෙක් හැටියට ඉන්නවා නම් ඒ කාර්යය තේරුම් ගන්න ඕන.

"බන්ධනාගාර සේවයේ තමන් ඉහළම නිලධාරියෙක් කියලා කියන්නට පුළුවන් වෙන්නේ ඒ බන්ධනාගාර සේවයෙන් ගෞරවණීය සේවයක් ජනතාව බලාපොරොත්තු වෙන ආකාරයට දෙනවා නම් පමණයි. නැත්නම් ඒක කියන්න බැනේ. එහෙම කියන්න පුළුවන් තත්ත්වයකට අද බන්ධනාගාර සේවය නැහැ. ඉතින් එතැනට මේක ගේන්න ඕන. කමිටුවක් හදලා මේක ප්‍රතිසංස්කරණය කරන වැඩපිළිවෙළක් හරිගස්සා ගන්න.

"අතීත් එක මට ප්‍රශ්නයක් නැහැ දේශපාලනය. දේශපාලනය නෙවෙයි මෙතැන වැදගත්කම. රාජකාරිය කරන එක. හරි දේ කරන එක. ඒකයි මෙතැන අවශ්‍යතාවය. ඉතින් ඒක නිසා හොඳ නිලධාරීන් ඉන්නවා කියලා කවුරුත් කියනවානේ. ඒ හොඳ නිලධාරීන්ට කරන්න පුළුවන් වෙන විදියට වැරදි නිලධාරීනුත් හද ගන්න. එහෙම හදන්න බැරි කොටසක් ඉන්නවා නම් ඒගොල්ලන්ට පඩි දීලා වෙනම සංචිතයට දලා පැත්තකට කරලා තියන්න."

ඇමැති නිමල් සිරිපාල ද සිල්වා, ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර, ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් එස්. එම්. මොහොමඩ් යන මහත්ම මහත්මීන් සහ ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පති, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ප්‍රමුඛ පොලිසියේ සහ බන්ධනාගාරයේ ඉහළ නිලධාරීහු ද සාකච්ඡාවට එක්ව සිටියහ.

කොවිඩ් -19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට මධ්‍යම පළාත් අධ්‍යාපන සේවක සණස සමිතියෙන් රුපියල් ලක්ෂ 2 ක මුදලක් පරිත්‍යාග කර තිබේ.
එම සංගමයේ සභාපති ටයි.එච්.එම්. බණ්ඩාර මහතා සහ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් විසින් අදළ චෙක්පත මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා වෙත බාර දෙනු ලැබිය. මහනුවර පුරපති කේසර සේනානායක,පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න යන මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.
ඡායාරූපය -අසේල කුරුළුවංශ

'ඉටුකම' අරමුදලේ ශේෂය මිලියන 1,230 ඉක්මවයි

ආයතනිකව හා පෞද්ගලිකව ලැබෙන පරිත්‍යාග හා සෘජු තැන්පතු සමඟ 'ඉටුකම' COVID - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය රුපියල් මිලියන 1,230 ඉක්මවා තිබේ.

මේ අතර WNS Global Services (Pvt) Ltd ආයතනය රුපියල් 5,895,000ක් සහ කිරිබත්ගොඩ, ඊරියවැටිය ශ්‍රී රත්න විහාරවාසී පූජ්‍ය බංග්ලාදේශයේ චන්ද්‍රජෝති හිමියෝ ද රුපියල් 100,000 ක් අරමුදලට පරිත්‍යාග කළහ. ඊට අදළ චෙක්පත් අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත බාර දෙනු ලැබිය. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය රුපියල් මිලියන 5ක් අරමුදලට පරිත්‍යාග කර ඇත. උපකුලපති මේජර් ජෙනරාල් මිලින්ද පීරිස් මහතා ඊයේ (02) ජනාධිපතිවරයා වෙත එම චෙක් පත බාර දුන්නේය.

සෞඛ්‍ය අමාත්‍යංශයේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ඒකකයේ ව්‍යාපෘති කළමනාකරණ අංශය රුපියල් 37,358.71, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය රුපියල් 145,183.30, පූජ්‍ය ලත්පඳුරේ රාහුල හිමි රුපියල් 100,000ක්, සිංහ ලෑන්ඩ් සේල් පෞද්ගලික සමාගම රුපියල් 500,000ක්, චන්දන සේනාරත්න මහතා රුපියල් 200,000ක් ද මේ වෙනුවෙන් පරිත්‍යාග කළහ.

'ඉටුකම' වෙබ් අඩවිය මඟින් ලැබී ඇති මුදල 1,146,200 කි. ඒ අනුව 'ඉටුකම' COVID - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය රුපියල් 1,230,748,037.77 කි. දෙස් විදෙස් පරිත්‍යාගශීලීහු ගිණුමට දායක වී සිටිති. චෙක් පත් හෝ ටෙලි ගාෆ් සම්ප්‍රේෂණ මඟින් මෙන්ම www.itukama.lk වෙබ් අඩවිය ඔස්සේ හෝ #207# අමතා අරමුදලට දායක විය හැකිය. දුරකථන අංක 0760700700/ 0112320880/ 011,2354340/ 0112424012 ඇමතීමෙන් වැඩි විස්තර දැන ගැනීමට හැකියාව පවතී.

හිටපු නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ අධිකරණයට ගෙනියද්දී අනතුරක් වුණා

- මහේස්ත්‍රාත්වරයා නිවාඩු කිව්වත් පාන්දරම වාහනයකින් රැගෙන ගියා
- අනතුර ගැන වැඩිදුර විමර්ශනයක් කරන්න දුන්නෙත් නෑ

සුභාෂිණී සේනානායක

හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා යාපනය මහේස්ත්‍රාත් අධිකරණයට රැගෙන යාමේ දී ඔවුන් ගමන් ගත් රිය අනතුරකට ලක් වූ බවත් එහිදී අනතුර සම්බන්ධයෙන් කටයුතු කිරීමට පවා ඉඩ ලබා නොදී ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා සහ සහකාර පොලිස් අධිකාරී තිසේරා මහතා තමාගේ වාහනය රැගෙන පාන්දර 4.00 ට පමණ ලලිත් ජයසිංහ මහතා අධිකරණයට ඉදිරිපත් කිරීමට රැගෙන ගිය බවත් කයිට්ස් පොලිසියේ හිටපු මූලස්ථාන පොලිස් පරීක්ෂක ධර්මදස මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා දීම සඳහා වන දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිෂන් සභාව හමුවේ ඊයේ (02) කියා සිටියේ ය.

එදින කයිට්ස් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා නිවාඩු මත සිටින බව එම අනතුර සිදු වූ ස්ථානයට පාන්දර තමා ගිය අවස්ථාවේ එම නිලධාරීන්ට පැවසූ බවත් තමාගේ කීම පිළිනොගෙන කයිට්ස් අධිකරණය වෙත සැකකරු තමාගේ ජීප් රථයට දමාගෙන රැගෙන ගිය බවත් ධර්මදස මහතා කියා සිටියේය. ඉන් අනතුරුව මහේස්ත්‍රාත්වරයා කයිට්ස් අධිකරණයේ නැති බවට සහ නිවාඩු මත සිටින බවට එහි ආරක්ෂක නිලධාරීන්ගෙන් දැනගෙන නැවත ලලිත් ජයසිංහ මහතා නල්ලූර් අධිකරණයේ වැඩ බලන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ බවට තමාගේ වාහනයේ රියදුරාගෙන් දැනගත් බව ද ධර්මදස මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා දීම සඳහා වන දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිෂන් සභාව ඊයේ (02) රැස් වූ අතර එම කොමිෂන් සභාවේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න, සෙසු සාමාජිකයන් වන හිටපු අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍ර, ජයතිලක, හිටපු පොලිස්පති චන්ද්‍ර, ප්‍රනාන්දු යන මහත්වරුන්ඉදිරියේ ධර්මදස මහතා මේ බව පැවසීය.

මෙහිදී කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතාට ඇප ලබා දීමට පිටත් වූ බව කියන වත්තල පදිංචි දවුද් ලෙබ්බේ මොහොමඩ් ඉස්තාර් මහතා කියා සිටියේ ලලිත් ජයසිංහ මහතා ගමන් ගත් වාහනයට පිටුපසින් තමන් ගමන් ගත් වාහනය ගමන් කළ බවත් යාපනය පසු කර කෙටි දුරක් යන විට ලලිත් ජයසිංහ මහතා ගමන් ගත් වාහනය අනතුරකට ලක් වූ බවත් ය. එහිදී ලලිති ජයසිංහ මහතා පාදයේ තුවාල සහිතව සිටිනු තමා දුටු බවත් හෙතෙම පැවසී ය.

"එම අනතුර සිදු වූ ස්ථානය දමිළ ජනයා වෙසෙන ස්ථානයක් බවට මම හඳුනා ගත්තා. වාහනය යකඩ උඩ තිබුණේ. තෙල් ටැංකිය පුපුරා ගියොත් ලලිත් ජයසිංහ මහතා අනතුරට ලක්වේවි යැයි මම එහි සිටි මහත පොලිස් නිලධාරියාට දැනුම් දී මගේ වාහනයෙන් රැගන යාමට යෝජනා කළා. එලෙස පෞද්ගලික වාහනවල රැගෙන යාමට බැරි බව ඒ මහතා එහිදී ප්‍රකාශ කළා." යැයි කොමිසමට දැනුම් දුන් ඉස්තාර් මහතා මෑතක දී පුවත්පත්වල පළ වූ වාර්තාවලට අනුව දැනට රට පැන සිටින නිශාන්ත යන නිලධාරියා ඒ මහත නිලධාරියා බවට තමා පුවත්පත් මඟින් හඳුනා ගත් බව ද කියා සිටියේය.

දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා කටයුතු කරන අතර එහි සෙසු සාමාජිකයන් ලෙස හිටපු අභියාචනාධිකරණ විනිසුරු චන්ද්‍ර, ජයතිලක සහ හිටපු පොලිස්පති චන්ද්‍ර, ප්‍රනාන්දු යන මහත්වරු කටයුතු කරති.

කොමිසමේ දී මෙසේ ද සාක්ෂි සටහන් විය.

ලලිත් ජයසිංහ මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා-

කුමන කාරණයකට ද ලලිත් ජයසිංහ මහතා රැගෙන විත් තිබුණේ?

සාක්ෂිකරු-

විදෑ දැරියගේ ඝාතනයට අදළව ලලිත් ජයසිංහ මහතා අධිකරණයට ඉදිරිපත් කිරීමට රැගන විත් තිබුණා.

නීතිඥවරයා-

කුමන වේලාවකට ද පොලිස් නිලධාරීන් සැකකරු ඉදිරිපත් කිරීම සඳහා කොළඹින් පිටත් වී තිබුණේ?

සාක්ෂිකරු-

2017.07.15 වැනිද පැය 16.00 ට කොළඹින් පිටත්ව තිබුණා

විනිසුරුවරයා-

කියට ද අනතුර සිදුවී තිබුණේ? සවස 4 සිට පාන්දර 4 වෙනකම් කයිට්ස්වලට යාමට කාලය ගත වෙනවා ද? අනතුර සිදු වූ ස්ථානයට ඔබ ගියාද? අනතුර ගැන ඔබ වෙනම විමර්ශනයක් සිදු කළා ද?

සාක්ෂිකරු-

එහෙමයි ස්වාමීනී. කයිට්ස්වලට යාමට කාලය ගත වන්නේ පැය 7 විනාඩි 45 වැනි කාලයක්. තේ, ආහාර අතරමඟ ලබා ගෙන තිබුණා. අනතුර ගැන මට දුරකථනයෙන් දැනුම් දුන්නා. ඒ අවස්ථාවේම මම සිද්ධිය වූ ස්ථානයට ගියා. එහිදී නිශාන්ත මහතා රියදුරා සහ තිසේරා මහතා සමඟ ලලිත් ජයසිංහ මහතා වාහනයේ ගමන් කර තිබූ බව දැන ගත්තා. එහිදී මම තුවාල තිබෙන අයව සොයා බැලුවා. ලලිත් ජයසිංහ මහතාගෙන් විමසීමක් කළා. එහිදී එතරම් ප්‍රශ්නයක් නැති බව දැනුම් දුන්නා. රියදුරා තවනාගෙන මගේ වාහනයේ රියදුරු සමඟ මාත් එම ස්ථානයට ගොස් විනාඩි 5 න් පමණ එම පිරිස පාන්දර 4.00 ට පමණ පිටත් කර හැරියා. එම පිරිසට දැනුම් දුන්නා කයිට්ස් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා නිවාඩු මත සිටින බව

විනිසුරුවරයා-

පාන්දර 4.00 ට මහේස්ත්‍රාත්වරුන් අධිකරණ කටයුතු සිදු කරනවා ද? සැකකරුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැකයක් මතු වූයේ නැද්ද?

සාක්ෂිකරු-

සුවිශේෂී තත්ත්වයන් මත ඔවුන් දැනුම් දී මහේස්ත්‍රාත්වරයා සමඟ කතා කර පැමිණෙන්න ඇති කියා මා සිතුවා.

විනිසුරුවරයා-

ඇයි අනතුර සම්බන්ධයෙන් වෙනම විමර්ශනයක් සිදු නොකළේ? සාමාන්‍ය රිය අනතුරක් වුවත් විමර්ශනයක් සිදු කරනවා නේද?මේ ගෙන යන්නේ ඉහළ පොලිස් නිලධාරියෙක්.මේ ගැන සැකයක් ඇති වුණේ නැද්ද?

සාක්ෂිකරු-

ස්වාමීනී විමර්ශනයක් කරන්න අවස්ථාවක් ලබා දුන්නේ නෑ නිශාන්ත කියන නිලධාරියා සහ තිසේරා යන නිලධාරීන්. මම රියදුරාගෙන් පමණක් ප්‍රකාශයක් ලබා ගත්තා.

නීතිඥවරයා-

ඒ අවස්ථාවේ ලලිත් ජයසිංහ මහතාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වුණේ නැද්ද? ඔහුට තුවාල සිදු වූ බවට දැන සිටියේ නැද්ද? අනතුර සම්බන්ධයෙන් දැනුවත් කළේ කවුද?

සාක්ෂිකරු-

ලලිත් ජයසිංහ මහතා රැගෙන යන අවස්ථාවේ දී විශේෂ කාර්ය බලකාය යොදවා ආරක්ෂාව ලබා දීමට කටයුතු කළා ස්වාමීනී. ඊළඟ නඩු දිනයේ දී ලලිත් ජයසිංහ මහතා අධිකරණයේ දී හමු වූ අවස්ථාවේ ඔහුගේ බෙල්ලේ ආවරණයක් යොද සිටි බවත් තුවාලවලට ප්‍රතිකාර කිර තිබූ බවත් දැන සිටියා. එහිදී මා ලලිත් ජයසිංහ මහතාට ආචාර කොට අධිකරණ භූමියේ දී කියා සිටියා වෛද්‍ය වාර්තා ලබා දෙන්න, ඒවා අධිකරණයට ඉදිරිපත් කරන්නම් කියා. අනතුර සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා, මා සිටි සිටි පොලිස් බල ප්‍රදේශය බාරව සිටි නියෝජ්‍ය පොලිස්පතිවරයා, පොලිස් මූලස්ථානය ඇතුළු නිලධාරීන් ට ෆැක්ස් පණිවිඩ මඟින් දැනුම්වත් කිරීම් සිදු කළා අනතුර සිදු වූ දිනම.

නීතිඥවරයා-

අනතුර සිදු වූ දින මාධ්‍ය ආයතනයකට එක් වෙමින් එවකට මාධ්‍ය ප්‍රකාශකවරයා අනතුරේ දී ලලිත් ජයසිංහ මහතා තුවාල ලබා සිටි බව දැන නොසිටි බව ප්‍රකාශ කර තිබුණා .ඒ කියන්නේ තමුන් දැනුවත් කළේ නෑ කියන එකද?

(හිරු නාලිකාවේ ප්‍රවෘත්ති විකාශයක් විනිසුරුවරුන් හමුවේ විකාශය කරයි.)

සාක්ෂිකරු-

නැත ස්වාමීනී, මා දැනුවත් කළා.

විනිසුරුවරයා-

හිතාමතාම පැමිණිලිකරු අනතුරකට ලක් කිරීම සැළසුම් කළා කියා සිතුණේ නැද්ද? ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු කළේ නැද්ද? පොලිස් නිලධාරියකු ලෙස තමාගේ රාකාරිය නිසි ලෙස ඉටු කළේ නැද්ද?

සාක්ෂිකරු-

විමර්ශන කිරීමට තරම් කාලයක් නිශාන්ත තිසේරා ප්‍රමුඛ නිලධාරීන් මා හට ලබා දුන්නේ නැහැ.

විනිසුරුවරයා-

තමුන් තමන්ගේ රාජකාරිය පැහැර හැරියා කියා පිළිගන්නවා ද?

සාක්ෂිකරු-

එහෙමයි ස්වාමීනී.

(මෙම සිද්ධියට අදළ සාක්ෂිකරුවකු වන වත්තල පදිංචි දවුද් ලෙබ්බේ මොහොමඩ් ඉස්තාර් මහතා කොමිසම හමුවට කැඳවයි.)

නීතිඥවරයා-

තමුන් මෙම සිදධිය දැනගන්නේ කොහාම ද?

සාක්ෂිකරු-

ලලිත් ජයසිංහ මහතා මගේ නිවසට යාබද නිවසේ ජීවත් වන්නේ ඒ මහතාගේ බිරිඳ මට දුරකථනයෙන් කතා කර කීවා ලලිත් ජයසිංහ මහතා යාපනය අධිකරණයට රැගෙන යනවා, ඔහුට ආරක්ෂාවක් නැහැ, ඔහු යන වාහනය පිටුපසින් යන්න කියා. දමිළ ජනතාව එම ප්‍රදේශයේ සිටින නිසා මම දමිළ කතා කරන නිසා කරදරයක් වුණොත් ඉදිරිපත් වෙන්න කිව්වා. ඒ අනුව මම තවත් දෙදෙනකුත් සමඟ පිටත් වුණා .ඒ අවස්ථාවේ මම මහනුවර සිටියේ. මම වවුනියාවේ සිට සර් ගෙනියන වාහනය පිටුපසින් ගියා.

නීතිඥවරයා-

එහිදී සිදු වූයේ කුමක්ද?

සාක්ෂිකරු-

එහිදී සර් ගිය වාහනය අනතුරකට ලක් වුණා. මම බය වුණා. වාහනය කණු දෙකක් උඩට ගොස් තිබුණා. සර් ඒ වාහනයේ පැයකට වැඩි කාලයක් හිටියා. එස්.ටී.එෆ්. එක හිටියා. මම කවුද කියා විමසුවා. මට ළඟට යන්න එපා කිව්වා. මම කිව්වා සර් ට ආරක්ෂාව නෑ, මගේ වාහනයේ ගෙනියමු කියලා. ඒකට ඒ අය කැමති වුණේ නෑ. සර් සිටි වාහනයෙන් සර් බහිද්දි හෙළක් තිබුණා. සර් බහින විට පරිස්සමින් බහින්න කියා මා කිව්වා. සර් සිටි වාහනයේ පෙට්‍රල් ටැංකිය පුපුරා අනතුරක් වේවි කියා මා බය වුණා. එහිදී එම ස්ථානයට පැමිණි පොලිස් නිලධාරියා කියනවා ඇහුණා අද කයිට්ස් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා නැති බව. එහෙත් සර් එතනට අරන් ගියා. පාන්දර 6.00 විතර වුණා. ආරක්ෂක නිලධාරීන්ගනේ මහේස්ත්‍රත්වරයා නැති බව දැනගෙන තවත් ගමක් දිගේ ගිහින් මහේස්ත්‍රාත්වරයකුගේ නිල නිවසකට සර් ව රැගන ගියා.

නීතිඥවරයා-

එහිදී සිදු වුණේ කුමක්ද?

සාක්ෂිකරු

සර් 25 දක්වා රිමාන්ඩ් කියා කීවා. සර් අනුරාධපුර බන්ධනාගාරයට රැගෙන යන බව කියා රැගෙන ආවා එම වාහනයේම. දවල් කෑම කෑවා මග දී. අපිට සර් ළඟට යන්න දුන්නේ නෑ. මම සර්ට පළතුරු අරන් දුන්නා. සවස තේ බොන්න නැවැත්තුවා. ඉන් අනතුරුව නිශාන්ත මහතා ට දුරකථන ඇමතුමක් ඇවිත් සර්ව නැවත යාපනය බන්ධනාගාරයට රැගෙන යන්න කියා දැනුම් දුන් බව කියමින් නැවත යාපනයට රැගෙන ගියා. අපිත් සර්ලා ගිය වාහනය පිටුපසින් ගියා. යාපනයේ දී සර්ව බන්ධනාගාර බස් එකකට නග්ග ගත්තා. නැවත සර් අනුරාධපුරයට රැගෙන එන් අවස්ථාවේ තිසේරා කියන නිලධාරියා වාහනයේ ආවේ නැහැ.

දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා දීම සඳහා වන දේශපාලන පළිගැනීම් පිළිබඳ කොමිෂන් සභාවේ ලබන ජූනි මස 12 වනද මෙම සිද්ධිය නැවත සැලකා බැලීමට විනිසුරු මඩුල්ල තියම කළේය.

කොමිසම අද (3) පෙරවරු 10.00 යළි රැස් වේ.